පාතදුම්බර ප්‍රාදේශීය සභාව

මහනුවර දිස්ත්‍රික්කය

-------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2017 ජූනි 16 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ජපන් තාක්ෂණික කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා පරිත්‍යාග ලෙස ලබා දී තිබුණු යන්ත්‍ර රේගුවෙන් නිදහස් කර ගැනීමට අදාළ රු.5,798,287 ක බැංකු ඇපකරය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

-----------------------

මාර්ග පුළුල් කිරීම, බැමි කඩා දැමීම, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම හා බෝක්කු අවහිර කිරීම සම්බන්ධයෙන් සභාවට විරුද්ධව පාර්ශවකරුවන් 11 දෙනෙකු අධිකරණයේ නඩු ගොනුකර ඇතත් ගිණුම් සටහන් මඟින් අනාවරණය කර නොතිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.36,908,481 ක් වූ ගිණුම් විෂයයන් 8 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.24,433,443 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 6 ක එකතු වටිනාකම රු.20,390,628 ක් වූ අතර, එයින් වසර 1-5 අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.9,089,127 ක් හා වසර 5 කට වඩා වැඩි කාලයක් ඉක්මවූ ශේෂය රු.11,301,501 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ණයහිමි ශේෂ 2 ක එකතු වටිනාකම රු.22,342,879 ක් විය. එයින් වසරකට වැඩි කාලයක් ඉක්මවූ ශේෂය එකතුව රු.4,491,813 ක් විය.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.28,233,339 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සනොයක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| | **නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) ඊ වගන්තිය | සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු සම්බන්ධව සමීක්ෂණයක් සිදු නොකිරීමෙන් රු.179,500ක ආදායමක් අහිමි වී තිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 762 | අවශ්‍යතාවය අනුව භාණ්ඩ මිලදී නොගෙන රු.1,600,040 ක ජල උපකරණ ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ පැවැතුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,993,024 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,271,762 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.19,278,738 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.19,278,738 ක අඩුවීමට වෙනත් ආදායම්වල රු.18,989,760 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

--------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයේ මුළු ජංගම වත්කම් හා මුළු ජංගම වගකීම් අතර, අනුපාතය පිළිවෙලින් 1.8:1 හා 2.5:1 වශයෙන් විය.

2.4 ආදායම් පරිපාලනය

-----------------------

2.4.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවට යන්ත්‍රෝපකරණ ඒකකයක් ස්ථාපිත කිරීමට ලබා දුන් යන්ත්‍රෝපකරණ වලින් ආදායම් වර්ධනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) ප්‍රදේශයේ ඇති මහා පරිමාණ ව්‍යාපාර හා වෙළඳ ආයතනවලින් කසල බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

2.4.2 වරිපනම්

-----------

සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.3,390,518 ක හිඟ ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.5,580,364 ක් විය. වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය හිඟ ශේෂයෙන් සියයට 47ක් හා වර්ෂයේ බිල් කිරීම් වලින් සියයට 59 ක් විය. 2016 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.4,061,470 ක් වූ අතර, එම ශේෂයෙන් වර්ෂයක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු.1,799,065 ක් විය.

2.4.3 බදුකුලී

---------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.401,331 ක හිඟ ශේෂයෙන් අයකර තිබුණේ රු.73,640ක් පමණි. එය හිඟයෙන් සියයට 18 ක් විය.

2.4.4 වෙනත් ආදායම්

------------------

ජල ගාස්තු

------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ රු.382,701 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.170,148 ක මුදලක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 44 ක අගයක් විය.

2.4.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,101,819 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.17,684,093 ක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

------------------

මඩවල වෙළඳ සංකීර්ණයේ ව්‍යුහාත්මක සැලැස්ම සාර්ථක පොදු වෙළඳ සංකීර්ණයක් සඳහා යෝග්‍ය නොවීම හේතුවෙන් පහත මාලයම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසා දමා තිබුණු අතර, මෙම සංකීර්ණය ප්‍රයෝජනයට ගතහැකි ආකාරයට සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේදී පාතදුම්බර සභාවේ මස් කඩය පවත්වාගෙන ගිය බදුකරු විසින් කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පෞද්ගලික මස්කඩයක් පවත්වාගෙන යාම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.2,635,247 ක අදායමක් අහිමි වී තිබුණි.

(ඇ) සභාව සතු කඩ කාමර 10 ක් 2015 පෙබරවාරි 01 දින සිට වර්ෂ 3 කට බදු දී තිබුණද, එකවර ගෙවීමේ මුදල් අය නොකිරීම හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ)	සභාව සතු මඩවල නගරයේ පිහිටි වර්ග අඩි 89 ප්‍රමාණයේ කඩ කාමර 2ක් 2013 වර්ෂයේ සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසා දමා තිබීමෙන් සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි.

3.3	මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ)	පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු රු.2,443,194 ක මුදලක් වසර 2 කට වඩා වැඩි කාලයක් අදාළ කාර්යය සඳහා නොයෙදවා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ)	මඩවල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 2014 අගෝස්තු 11 දින තක්සේරු කර තිබුණද එකී තක්සේරු කුලිය අය නොකිරීම හේතුවෙන් රු.244,200 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ)	සභාව සතු රු.3,480,000 ක් වටිනා අංක RD - 6660 දරන ගලි බවුසරය හා රු.3,000,000 ක් වටිනාකම වූ ස්කැවේටරය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සභා පරිශ්‍රයේ හා කසල දමන පරිශ්‍රයේ දමා තිබුණි.

3.4	නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්
---------------------------------------
රු.1,260,000 ක් වටිනා වාහන 3 ක් වසර 8 ක කාලයක සිට නිෂ්ක්‍රීයව පවත්නා අතර, එම වාහන අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5	ව්‍යාපෘති ප්‍රමාද කිරීම
------------------------
2016 වර්ෂයේ ඉටු කිරීමට අනුමත කර තිබුණු රු.325,000 ක් වටිනාකම වූ කර්මාන්ත 4 ක් 2017 මැයි 31 දින වන විටත් නිමකර නොතිබුණි.

3.6	ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------
දෛනිකව ජනනය වන අපද්‍රව්‍ය ටොන් 2 ක් පමණ සභාවේ සේවකයන් හා ට්‍රැක්ටර් යොදාගෙන එකතුකර දිරන හා නොදිරන ලෙස වෙන්කර කුණ්ඩසාලේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට භාරදී තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය
--------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) ආදායම් විෂයයන් 46 ක් සඳහා සලසා දී තිබුණු රු.5,346,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 6 ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සියයට 11 සිට සියයට 72 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

(ඇ) ආදායම් විෂයයන් 6 ක ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම් අතර සියයට 6 සිට සියයට 55 අතර පරාසයක විචලනයක් පැවතුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය
-------------------------

අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරියෙක් පත් කර ඇතත් එම නිලධාරියාට වෙනත් රාජකාරී පවරා තිබීම හේතුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු
---------------------------------------

සභාවේ විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය තුල කමිටු රැස්වීම් 3 ක් පමණක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලනය

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ගිණුම්කරණය

(ඇ) වාහන පාලනය

(ඈ) ආදායම් පාලනය

(ඉ) ණයගැතියෝ සහ ණයහිමියෝ

(ඊ) කොන්ත්‍රාත් පාලනය